කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

දූරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨය

ව්‍යාපාර කළමනාකරණවේදී (සාමාන්‍ය) උපාධි දෙවන පරීක්ෂණය (බාහිර) - 2013

ජනවාරි - 2017

**BMGT E 2035 - කළමනාකරුවන් සඳහා ගිණුම්කරණය**

ප්‍රශ්න සංඛ්‍යාව : හතරයි (04) කාලය : පැය 03 යි

උපදෙස් :

(1) සියලු ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(2) සෑම ප්‍රශ්නයකටම සමාන ලකුණු හිමිවේ.

**ප්‍රශ්න අංක 01**

අන්‍යොන්‍ය වශයෙන් බහිෂ්කාර වන ව්‍යාපෘති දෙකක් ව්‍යාපාරයන් සැලකිල්ලට ගෙන ඇත. ව්‍යාපෘති දෙකේම ආයු කාලය වසර 5 ක් වන අතර මූල්‍ය ආයෝජනය රු. 100,000 කි. සමාගමට වන බදු අනුපාතිකය 50% කි. සමාගම අපේක්ෂා කරන උපරිම ප්‍රතිලාභ අනුපාතය 10% කි. ව්‍යාපෘති දෙක සඳහාම අපේක්ෂිත ක්ෂය ක්‍රමය සරල මාර්ග ක්‍රමයයි. අදාල ව්‍යාපෘති දෙකෙහි බදු පෙර ශුද්ධ මුදල් ප්‍රවාහය (ඉදිරි වර්ෂ 5 සඳහා) පහත දක්වා ඇත.

| වසර | ව්‍යාපෘතිය x (රුපි.) | ව්‍යාපෘතිය y (රුපි.) |
|---|---|---|
| 1 | 40,000 | 60,000 |
| 2 | 40,000 | 30,000 |
| 3 | 40,000 | 20,000 |
| 4 | 40,000 | 50,000 |
| 5 | 40,000 | 50,000 |

ඉහත සඳහන් තොරතුරු උපයෝගීකරගෙන ඔබ විසින් එකිනෙක ව්‍යාපෘතිය සඳහා පහත දෑ ගණනය කල යුතුයි.

ආ) පිලිගෙවුම් කාලය (ලකුණු 05)

ආ) ශුද්ධ වර්තමාන අගය සහ ලාභදායකත්ව දර්ශකය

(ලකුණු 10)

ඇ) අභ්‍යන්තර ප්‍රතිලාභ අනුපාතය

(ලකුණු 05)

ඈ) ඔබගේ ගණනය කිරීම් පදනම් කරගෙන කුමන ව්‍යාපෘතිය පිලිගත යුතුදැයි උපදෙස් දෙන්න.

(ලකුණු 05)

**(මුළු ලකුණු 25)**

**ප්‍රශ්න අංක 02**

ගොවිපල නිෂ්පාදන චීනයෙන් ආනයනය කරනු ලබන F.F.D සහ සමාගමේ (FFD) ගිණුම්කරණ තොරතුරු විශ්ලේෂණය කිරීම සඳහා MMD බැංකුව ඔබගේ සේවය ලබාගෙන ඇත. ඔබගේ සහායකයෙකු පහත තොරතුරු ඔබට ලබාදෙන ලදී.

| අනුපාතය | 2013 | 2012 | 2011 | 2013 කර්මාන්තයේ සාමාන්‍යය |
|---|---|---|---|---|
| දිගුකාලීන ණය | 0.45 | 0.40 | 0.35 | 0.35 |
| තොග පිරිවැටුම | 62.65 | 42.42 | 32.25 | 53.25 |
| මුලු වත්කම මත ක්ෂය | 0.25 | 0.014 | 0.018 | 0.015 |
| ණයගැති පිරිවැටුම් කාලය (දින) (එකතුකිරීමේ කාලය) | 113 | 98 | 94 | 130.25 |
| ස්කන්ධ මත ණය අනුපාතය | 0.75 | 0.85 | 0.90 | 0.88 |
| ලාභාන්තිකය | 0.082 | 0.07 | 0.06 | 0.075 |
| මුලු වත්කම් මත පිරිවැටුම් අනුපාතය | 0.54 | 0.65 | 0.70 | 0.40 |
| ක්ෂණික අනුපාතය | 1.028 | 1.03 | 1.029 | 1.031 |
| ජංගම අනුපාතය | 1.33 | 1.21 | 1.15 | 1.25 |
| පොලී ඉපයූ වාර ගණන (පොලී සහ බදු පෙර ලාභය/ පොලී) (පොළී ආවරණය) | 0.9 | 4.375 | 4.45 | 4.65 |
| ස්කන්ධ ගුණිතය (වත්කම් ස්කන්ධය | 1.75 | 1.85 | 1.90 | 1.88 |

අ) සමාගමේ වාර්ෂික වාර්තාවේ සමාගමේ ප්‍රධාන විධායක නිලධාරී පහත වගන්තිය ඇතුලත් කර ඇත. "කෙටිකාලීන වගකීම් සපුරාලීමට ඇති හැකියාව පිළිබඳව සැලකීමේදී 2011 වර්ෂය යහපත් වර්ෂයකි. ඉහල ද්‍රවශීලතාවයක් ඇති ජංගම වත්කම් (මුදල්, ණයගැතියෝ හා කෙටිකාලීන අලෙවිකළහැකි සුරැකුම්පත්) වැඩිවීම නිසා අපි ඉහල ද්‍රවශීලතාවයක සිටියෙමු." ප්‍රධාන විධායක නිලධාරියාගේ ප්‍රකාශය නිවැරදිද? විස්තර කරන්න.

(ලකුණු 10)

ආ) සමාගමේ වත්කම් කළමනාකරණය පිළිබඳව ඔබට කුමක් පැවසිය හැකිද?

(ලකුණු 08)

ඇ) සමාගමේ කොටස්කරුවන් වෙත සමාගමේ නුඹුන්වන්භාවය සහ තෝලනය පිළිබඳ ඇගයීමක් කරන ලෙස ඔබට දන්වා ඇත. අගයන්න.

(ලකුණු 07)

**(මුළු ලකුණු 25)**

**ප්‍රශ්න අංක 03**

(අ) සාමාන්‍ය විචල්‍ය පිරිවැය ඒකකයක් සඳහා රු. 5.00 කි. සතියක විකුණුම් ඒකක 1000 කි. සාමාන්‍ය ස්ථාවර පිරිවැය ඒකකයක් සඳහා රු. 5.00 කි. ඒකකයක වෙළඳපල විකුණුම් මිල ඒකකයක් රු. 12.00 කි.

i. මුලු ලාභය ගණනය කරන්න.

ii. මුලු පිරිවැය සඳහා සූත්‍රයක් ගොඩනගන්න.

iii. සමච්ඡේද ලක්ෂයේ ඒකක සංඛ්‍යාව ගණනය කරන්න.

iv. සමාගම සතියක ලාභය රු. 3400 ක් ලෙස සැලසුම් කරගන්නේ නම් සතියක විකුණුම් ඒකක සංඛ්‍යාව කුමක් විය යුතුද?

(ලකුණු 08)

(ආ) පහත දක්වා ඇති අවස්ථා සඳහා සමච්ඡේද ලක්ෂ ප්‍රස්ථාර නිර්මාණය කරන්න.

i. නිමැවුම් මිල ඉහලයාම

ii. විචල්‍ය යෙදවුමක මිල පහත යාම

iii. ස්ථාවර පිරිවැය පහත යාම

(ලකුණු 09)

(ඇ) සමාගම තොග අයිතම "6786" ක් වසරක භාවිතාකරන ප්‍රමාණය ඒකක 15,000 කි. ඒකකයක ගැනුම් මිල රු. 4.00 කි. ඇනවුම් පිරිවැය රු. 220 කි. වාර්ෂික තොග පවත්වාගෙනයාමේ පිරිවැය ඒකක ගැනුම් මිලෙන් 10% කි.

i. තොග අයිතම '6786' සඳහා ආර්ථික ඇනවුම් ප්‍රමාණය කුමක්ද?

ii. තොග පවත්වාගෙන යාමේ පිරිවැය ඉහලයාම

a) ආර්ථික ඇනවුම් මට්ටම

b) වාර්ෂික ඇනවුම් පිරිවැය

මත ඇතිකරන බලපෑම කුමක්ද?

(ලකුණු 08)

ප්‍රශ්න අංක 04

පහත සඳහන් තොරතුරු ලබාගන්නේ ABC සමාගමේ 201X සැප්තැම්බර් 30 ට අවසන් වර්ෂය සඳහා වන ව්‍යාපාරික සැලැස්ම තුළිනි.

| **විකුණුම් සත්‍ය** | රු. ,000 |
|---|---|
| ජනවාරි 201x | 85,000 |
| පෙබරවාරි 201x | 95,000 |
| **පුරෝකථනය** | |
| මාර්තු 201x | 55,000 |
| අප්‍රේල් 201x | 60,000 |
| මැයි 201x | 65,000 |
| ජූලි 201x | 55,000 |

අතිරේක තොරතුරු

i. මුලු විකුණුම්වලින් අත්පිට විකුණුම් 20% කි. ABC හි දළ ලාභාන්තිකය විකුණුම්වලින් 25% කි. තොග ඒකාකාරීව පවත්වාගෙන යන අතර එය ඊළඟ මාසයේ ඇස්තමේන්තුගත විකුණුම් වලින් 80% කි.

ii. ණයගැතියන්ගෙන් 60% විකුණුම්වලට පසු මාසය තුල එකතුකරගන්නා අතර ඉතිරිය විකුණුම් සිදුවූ මසට එළඹෙන දෙවන මස තුල රැස්කර ගනු ලබයි.

iii. 201x ජනවාරි සමාගම රු. මිලියන 2 ක් 25% අත්තිකාරමක් ලෙස ඇසුරුම් යන්ත්‍රයකට ගෙවන ලදී. එය ප්‍රවාහන කර ස්ථාපිත කරන ලද්දේ 201x පෙබරවාරි මාසයේදීය. එය මාස 2 ක් පරීක්ෂක ධාවනයකට භාජනය කලයුතුයි. මුලු පිරිවැයෙන් 50% ක් ස්ථාපනය කල මසට පසු මස සහ ඉතිරිය පරීක්ෂක ධාවනය අවසානයේ ගෙවීමට එකඟ විය.

iv. ණයහිමියන් මිලදී ගැනුම් සිදුකල මසට පසු මාසයේදී ගෙවනු ලැබේ.

v. පරිපාලන සහ විකුණුම් වියදම් පිළිවෙලින් විකුණුම් වලින් 16% සහ 24% ක් ලෙස ඇස්තමේන්තු කර ඇති අතර අදාල මාසය තුලදීම දරනු ලැබේ. ABC හි අතැති මුදල් සහ බැංකු ශේෂය රු. මිලියන 100 (29 පෙබරවාරි 201x) වේ.

මාසික මූල්‍ය අය වැය පිළියෙල කරන්න.

201x මාර්තු 31 න් අවසන් කාර්තුව සඳහා)

(ලකුණු 25)